# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2224/20 - 2021 අප්‍රේල් මස 21 වැනි බදාදා - 2021.04.21

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස : (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

**6 වන සංශෝධනය**

ශ්‍රී ලංකා ක්‍රමසම්පාදන සේවයේ සේවා ව්‍යවස්ථාව

අංක 1783/37 හා 2012 නොවැම්බර් 09 දිනැති, අංක 1816/32 හා 2013 ජුනි 28 දිනැති, අංක 1992/77 හා 2016 නොවැම්බර් 11 දිනැති, අංක 2137/26 හා 2019 අගෝස්තු 20 දිනැති සහ අංක 2196/42 හා 2020 ඔක්තෝබර් 08 දිනැති ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අති විශෙෂ ගැසට් පත්‍ර* මගින් සංශෝධිත අංක 1670/32 හා 2010 සැප්තැම්බර් 10 දිනැති ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලද ශ්‍රී ලංකා ක්‍රමසම්පාදන සේවයේ සේවා ව්‍යවස්ථා සංග්‍රහය පහත දැක්වෙන ආකාරයට සංශෝධනය කරනු ලැබේ. එහි සඳහන් අනෙකුත් කරුණු හා කොන්දේසි නොවෙනස්ව පවතී.

රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නියෝග පරිදි,

**එම්. ඒ. බී. දයා සෙනරත්,**
ලේකම්,
රාජ්‍ය සේවා කොමිෂන් සභාව.

2021 මාර්තු මස 16 වැනි දින.

7.2.2.4 ශ්‍රී ලංකාව තුළ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමට මෙන්ම තම සේවාවේ භූමිකාව සහ කාර්යභාරය හොඳින් ඉටු කිරීමට අවශ්‍ය කායික සහ මානසික යෝග්‍යතාවයකින් යුක්ත වීම.

7.2.2.5 වෙනත් :

අනු අංක (III) ඉවත් කරනු ලැබේ. අනෙකුත් කරුණු එලෙසම පවතී.

7.2.4.1 ලිඛිත විභාගය :

විවෘත ධාරාව යටතේ බඳවා ගැනීමට අදාළ ලිඛිත විභාගය කොටස් දෙකකින් සමන්විත වේ. එම විභාගය හා සම්බන්ධ කරුණු ‘අ’ පරිශිෂ්ඨයේ දැක්වේ.

1A - G 34212 – 30 (2021/04)

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

7.3.2.5. වෙනත් :

III. උසස් කිරීම සඳහා සුදුසුකම් පරීක්ෂා කරනු ලබන දිනට රාජ්‍ය සේවා කොමිෂන් සභා චක්‍රලේඛ අංක 01/2020 හි සඳහන් විධිවිධානයන්ට අනුකූලව විනයානුකූල දඬුවමක් ලබා නොතිබිය යුතුය.

7.4 කුසලතා මත බඳවා ගැනීම : අදාළ නොවේ.

7.4.1 සිට 7.4.4 දක්වා කොටස් සම්පූර්ණයෙන් ඉවත් කරනු ලැබේ.

10. ශ්‍රේණි උසස් කිරීම

10.1. III වැනි ශ්‍රේණියේ සිට II වැනි ශ්‍රේණියට උසස් කිරීම

10.1.1.1. සපුරාලිය යුතු අවශ්‍යතා

(v) උසස් කිරීම සඳහා සුදුසුකම් පරීක්ෂා කරනු ලබන දිනට රාජ්‍ය සේවා කොමිෂන් සභා චක්‍රලේඛ අංක 01/2020 හි සඳහන් විධිවිධානයන්ට අනුකූලව විනයානුකූල දඬුවමක් ලබා නොතිබිය යුතුය.

10.2. II වැනි ශ්‍රේණියේ සිට I වැනි ශ්‍රේණියට උසස් කිරීම

10.2.1.1. සපුරාලිය යුතු අවශ්‍යතා

(iii) උසස් කිරීම සඳහා සුදුසුකම් පරීක්ෂා කරනු ලබන දිනට රාජ්‍ය සේවා කොමිෂන් සභා චක්‍රලේඛ අංක 01/2020 හි සඳහන් විධිවිධානයන්ට අනුකූලව විනයානුකූල දඬුවමක් ලබා නොතිබිය යුතුය.

දැනට පවතින “අ” පරිශිෂ්ඨය වෙනුවට මෙම “අ” පරිශිෂ්ඨය ආදේශ කරනු ලැබේ.

**“අ” පරිශිෂ්ඨය**

**විවෘත ධාරාව යටතේ ශ්‍රී ලංකා ක්‍රමසම්පාදන සේවයේ තුන්වැනි (III) ශ්‍රේණියට බඳවා ගැනීම සඳහා පවත්වනු ලබන ලිඛිත තරග විභාගයෙහි විෂය නිර්දේශය**

**01. විභාග පරිපාටිය හා විෂය නිර්දේශයන් :**

රජයේ විධායක නිලධර ගණයේ III ශ්‍රේණියේ පුරප්පාඩු පිරවීම සඳහා වන පොදු තරග විභාගය මේ සඳහා අදාළ වේ. මෙම විභාගය විභාග කොමසාරිස් ජනරාල්වරයා විසින් වාර්ෂිකව පැවැත්වීමට කටයුතු කරනු ඇත. එම තරග විභාගයේ පළමු කොටසේ (පොදු කොටස) එක් එක් ප්‍රශ්න පත්‍රයෙන් 40% වැඩි සහ මුළු ලකුණු ප්‍රමාණය 100ක් හෝ ඊට වැඩි ලකුණු ප්‍රමාණයක් ලබාගන්නා අයදුම්කරුවන් පමණක් ඉහත විභාගයේ දෙවන කොටස සඳහා කැඳවනු ලැබේ.

(අ) රජයේ විධායක නිලධර ගණයේ III ශ්‍රේණියේ පුරප්පාඩු පිරවීම සඳහා පවත්වනු ලබන පොදු තරග විභාගයේ පළමු කොටස (පොදු කොටස)

(I) සාරංශය

| *ප්‍රශ්න පත්‍රය* | *කාලය* | *ප්‍රශ්න පත්‍රයේ ස්වභාවය* |
|---|---|---|
| 1. බුද්ධි පරීක්ෂණය | පැය 1 ½ | ලකුණු 100, සමත් ලකුණ 40යි.<br>බහුවරණ ප්‍රශ්න සහ / හෝ කෙටි ප්‍රශ්නවලින් සමන්විත වේ. |
| 2. අවබෝධය | පැය 02 | ලකුණු 100, සමත් ලකුණ 40යි.<br>බහුවරණ ප්‍රශ්න සහ / හෝ කෙටි ප්‍රශ්නවලින් සමන්විත වේ. |

(II) විෂය නිර්දේශය

| *බුද්ධි පරීක්ෂණය* |
|---|
| අපේක්ෂකයා සතු තර්කනය, ආදේශනය, අර්ථකථනය, සම්බන්ධතා දැකීම, පරිවර්තනය, ගැටලු විසඳීමේ හැකියාව, හේතුඵල සම්බන්ධතා අවබෝධ කර ගැනීම, පුරෝකථනය, තොරතුරු සංවිධානය, රටා හඳුනාගැනීම සහ උපදෙස් පිළිපැදීම ආදී හැකියා මැනීම සඳහා සකස් කරනු ලබන බහුවරණ වර්ගයේ ප්‍රශ්නවලින් යුක්ත වේ. |
| *අවබෝධය* |
| අපේක්ෂකයා සතු කරුණු අවබෝධ කර ගැනීමේ හැකියාව, සන්නිවේදන කුසලතා, සාරාංශකරණය, විවරණය හා නිර්මාණාත්මක බව ආදී කුසලතා මැනීම සඳහා සකස් කරනු ලබන වාස්තවික ප්‍රශ්නවලින් යුක්ත වේ. |

*(ආ)* රජයේ විධායක නිලධර ගණයේ III ශ්‍රේණියේ පුරප්පාඩු පිරවීම සඳහා පවත්වනු ලබන පොදු තරග විභාගයේ දෙවන කොටස (ශ්‍රී ලංකා ක්‍රමසම්පාදන සේවයට බඳවා ගැනීමට අදාළ විශේෂිත කොටස)

(I) සාරංශය

| *ප්‍රශ්න පත්‍රය* | *කාලය* | *ප්‍රශ්න පත්‍රයේ ස්වභාවය* |
|---|---|---|
| සාමාන්‍ය සම්ප්‍රජානනය | පැය 03 | ලකුණු 100, සමත් ලකුණ 40 යි.<br>ව්‍යුහගත රචනා, බහුවරණ ප්‍රශ්න සහ / හෝ කෙටි ප්‍රශ්නවලින් සමන්විත වේ. |

(II) විෂය නිර්දේශය

| *සාමාන්‍ය සම්ප්‍රජානනය* |
|---|
| ශ්‍රී ලංකාවේ භූගෝලීය, දේශපාලනීය, ආර්ථික සාමාජයීය හා සංස්කෘතික පරිසරය ඇතුළු ශ්‍රී ලංකාවේ මුළු පරිසරය පිළිබඳව සහ අන්තර්ජාතික වශයෙන් වැදගත් වන්නා වූ කාලීන තත්ත්වයන් මෙන්ම විද්‍යාත්මක සහ තාක්ෂණ වර්ධනයන් පිළිබඳව අපේක්ෂකයාගේ සම්ප්‍රජානනය පිරික්සීම සඳහා වූ ප්‍රශ්නවලින් සමන්විත වේ. |

**02. විභාග මාධ්‍යය :**

I. මෙම විභාගය සිංහල, දෙමළ හා ඉංග්‍රීසි භාෂාවන්ගෙන් පැවැත්වේ.

II. අපේක්ෂකයන් කැමති එක් භාෂාවකින් විභාගයට පෙනී සිටිය හැකිය.

III. අපේක්ෂකයින් මෙම විභාගයේ සියලුම ප්‍රශ්න පත්‍රවලට පෙනී සිටිය යුතු අතර ඒ සඳහා එක් භාෂා මාධ්‍යයක් පමණක් තෝරාගත යුතුය.

IV. අපේක්ෂකයෙකුට ස්වකීය අයදුම්පතෙහි දැක්වෙන විභාග මාධ්‍ය වෙනස් කිරීමට අවසර දෙනු නොලැබේ.

**03. පත් කරනු ලැබීම සඳහා තෝරාගැනීමේ ක්‍රමය:**

සෑම ලිඛිත ප්‍රශ්න පත්‍රයක් සඳහාම නියමිත ලකුණුවලින් යටත් පිරිසෙයින් 40% ක් හෝ ඊට වැඩි ලකුණු ලබාගත් අයදුම්කරුවන් පමණක් සම්මුඛ පරීක්ෂණයට කැඳවනු ලබන අතර සම්මුඛ පරීක්ෂණයේ දී සුදුසුකම් සනාථ කළ අයදුම්කරුවන්, ලිඛිත විභාගයේ දී ලබා ඇති ලකුණු කුසලතා අනුපිළිවෙල සහ රජයේ විධායක නිලධර ගණයේ III ශ්‍රේණියේ පුරප්පාඩු පිරවීම සඳහා පවත්වනු ලබන පොදු තරග විභාගයට අයදුම් කරනු ලබන අවස්ථාවේ සටහන් කරනු ලබන සේවා මනාපය අනුව පත් කිරීම සඳහා තෝරාගනු ලැබේ.

05 - 25

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.